# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2213/34 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 10/2017 (III)

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2021 අංක 1 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝගවල සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එම සීමා, නියම සහ කොන්දේසිවලට යටත්ව, පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ බලයලත්, විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.

1A - PG 5298 — 450 (2021/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන තැනැත්තාගේ සද්භාවය ; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකුල වන බව,

ඒ සඳහා වූ ලේඛනගත සාක්ෂි ලබාගැනීම මගින් නිශ්චය කරගනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම (1) වන ඡේදයේ කාර්යය සඳහා යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත්වන, යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි පරිදි යම් ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය.

6. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො);

(ආ) යූරෝ;

(ඇ) ස්ටර්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බි; සහ

(ග) නවසීලන්ත ඩොලර්.

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින්, කලින් කලට (1) වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

7. 2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ සාදනු ලැබූ 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

එසේ වුව ද, ඉහත සඳහන් නියෝග පරිච්ඡින්න කිරීම නොතකා, 2020 දෙසැම්බර් මස 18 වන දින අංක 2206/25 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද, 2020 ජූලි මස 2 වන දින අංක 2182/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ කරන ලද නියමය, එසේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ දී බල පැවැත්විය යුතු ය.

8. මේ නියෝගයන්හි කාර්යය සඳහා-

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"කොළඹ කොටස් හුවමාරුව" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කරන ලද සහ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සඳහා 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ප්‍රදානය කළ කොළඹ කොටස් හුවමාරුව අදහස් වේ;

"ඇපයෙන් සීමිත සමාගම්" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා" යන්නෙන්, මේ නියෝගවල උපලේඛනයේ I වන කොටසේ 3 වන ඡේදයේ සඳහන් වූවන් හැර මේ නියෝගවල උපලේඛනයේ I වන කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවෙහි 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු අදහස් වේ;

"විගාමිකයා" යන්නට, කලින් කලට සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සේවක කොටස් හිමිකම් සැලැස්ම හෝ සේවක කොටස් වරණීය ක්‍රමය" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක් එහි කොටස් හෝ සමූහ සමාගමේ කොටස්, ශ්‍රී ලංකාව තුළ ඇති එම සමාගමේ ශාඛාවක හෝ පාලිත සමාගමක සේවකයන් හට අත්කර ගැනීම සඳහා අවස්ථාවක් පිරිනමන සැලැස්මක් හෝ ක්‍රමයක් අදහස් වේ;

"සමීපත ම පවුලේ සාමාජිකයන්" යන්නෙන් අදාළ තැනැත්තාගේ දෙමාපියන්, කලත්‍රයා සහ දරුවන් අදහස් වේ;

"ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" යන්නෙන්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විදේශ සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන්, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අදහස් වේ;

"ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන" යන්නට, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(2 වන නියෝගය)

**උපලේඛනය**

I වන කොටස

**ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු**

1. යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු වෙත-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් හෝ වරණීය කොටස් හෝ ණයකර හෝ සංස්ථායී බැඳුම්කර, නියාමනය කරන ලද ඒකක භාරවල හෝ අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකක සහ ආයෝජනය සිදු කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීමක ශ්‍රේණියට හෝ ඊට ඉහළින් ශ්‍රේණිගත කර ඇති විදේශීය රජයන් විසින් නිකුත් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කර අත්කර ගැනීම, දැරීම හෝ බැහැර කිරීම සඳහා;

(ආ) (තනි පුද්ගලයකු විසින් හැර) විදේශ රටක ශාඛාවක්, සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් (විදේශීය කාර්යාලයක්) පිහිටුවීම සඳහා සහ පවත්වා ගෙන යාම සඳහා,

අවසර දෙනු ලැබේ.

2. (1) ඉහත 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගණුදෙනුවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ, මේ නියෝගවල විධිවිධානවලට සහ පහත දැක්වෙන 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත්ව, සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලබන ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරනු ලැබිය යුතු ය.

**1 වන වගුව - ප්‍රතිමුඛ ආයෝජන සඳහා වන සීමාවන්**

| | *I වන තීරය*<br>*සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා* | *II වන තීරය*<br>*අවසරලත් සීමාවන්* | *III වන තීරය*<br>*ආයෝජන වර්ගය* |
|---|---|---|---|
| (i) | කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම් | ලිත් වර්ෂයක් සඳහා එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.) 2,000,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | සාමාන්‍ය කොටස්, ඒකක, වරණීය කොටස්, සංස්ථායී බැඳුම්කර, ණයකර සහ ස්වෛරීත්ව බැඳුම්කර |
| (ii) | කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තු ගත නොකළ සමාගමක් | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | |
| (iii) | මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ (ඉහත (i) සහ (ii) යටතේ සුදුසුකම්ලත් | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | |

| | *I වන තීරය* *සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා* | *II වන තීරය* *අවසරලත් සීමාවන්* | *III වන තීරය* *ආයෝජන වර්ගය* |
|---|---|---|---|
| | ආයෝජකයන් හැර) නියාමනය කරනු ලබන හෝ බලපත්‍රලාභී අස්ථිත්වයන් | | |
| (iv) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හෝ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් අර්ථසාධක අරමුදලක් | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | සාමාන්‍ය කොටස්, ඒකක, වරණීය කොටස්, සංස්ථායී බැඳුම්කර, ණයකර සහ ස්වෛරීත්ව බැඳුම්කර |
| (v) | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක් | ජීවිත කාලයටම, එ.ජ.ඩො. 300,000 ක් හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | |
| (vi) | පුද්ගලයකු හෝ (සමස්තයක් වශයෙන්) එකී පුද්ගලයාගේ තනි පුද්ගල ව්‍යාපාරයක් | ජීවිත කාලයටම, එ.ජ.ඩො. 200,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | |
| (vii) | සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 300,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | විදේශීය කාර්යාල |
| (viii) | බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් | ශාඛා කාර්යාල |
| | **සීමාවන්ට යටත් නොවන අවසරලත් ආයෝජන** | | |
| (ix) | පුද්ගලයකු | සේවක කොටස් හිමිකම් සැලැස්මෙහි හෝ සේවක කොටස් වරණීය ක්‍රමයෙහි සංස්ථා ප්‍රකාශයේ ඇති මුදල් ප්‍රමාණය දක්වා | සේවක කොටස් හිමිකම් සැලැස්මෙහි/ සේවක කොටස් වරණීය ක්‍රමයෙහි කොටස්වල ආයෝජනය කිරීම. |
| (x) | බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (ආයෝජනය, විදේශයන්හි බැංකු කටයුතු සඳහා වන්නේ නම් පමණක්) | ආයෝජිත රටෙහි නියාමකවරයා විසින් පනවනු ලබන සීමාව දක්වා | පාලිත සමාගමක කොටස්වල ආයෝජනය කිරීම හෝ ශාඛා කාර්යාලයක ආයෝජනය කිරීම |

(2) ඉහත 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති ආයෝජන සඳහා වන සමස්ත සීමා, මේ නියෝග යටතේ සිදු කරන ලද සමස්ත ආයෝජන සහ ඉවත් කරන ලද විනිමය පාලන පනත ප්‍රකාර නිකුත් කරන ලද 2011 ජනවාරි මස 1 වන දිනැති අංක 1686/50 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය සහ 1686/52 සහ 1686/53 දරන *අති විශෙෂ ගැසට් පත්‍රවල* පළකරන ලද දැන්වීම් සහ 2017 නොවැම්බර් මස 17 වන දිනැති අංක 2045/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග මගින් ප්‍රදානය කරන ලද පොදු අවසරය ප්‍රකාරව මින් පෙර සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ගෙවීම්වලින් සමන්විත විය යුතු ය.

3. ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන, ඇපයෙන් සීමිත සමාගමක් සහ ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නීති කෘත්‍යයක් හෝ, පනතේ විධිවිධාන ප්‍රකාරව අභිචෝදනා කිරීමක්, විමර්ශනයක් හෝ යම් ආපසු අය කර ගැනීමේ නඩුවක් පවතින්නේ ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකුට එරෙහිව ද එකී තැනැත්තා උපලේඛනයේ මේ කොටස යටතේ අවසර ලබා දී ඇති කාර්යයන් සඳහා ප්‍රාග්ධන ගණුදෙනු සිදු කිරීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

4. උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන් නොතකා, නිකුත් කරන්නා විසින් සිදු කරන ලද සංස්ථායී ක්‍රියාවක් ප්‍රකාරව හෝ මේ නියෝග යටතේ අත්පත් කරගන්නා ලද වරණීය කොටස්, ණයකර හෝ සංස්ථායී බැඳුම්කර පරිවර්තනය කිරීමක් මගින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම්වල ඒකාබද්ධ වීමක් හෝ සම්බන්ධනය වීමක් මගින් එම ආයෝජකයා වෙත පැවරෙන කොටස් අත්පත් කර ගැනීම හෝ දැරීම සඳහා උපලේඛනයේ මේ කොටසේ 1 වන ඡේදය යටතේ ආයෝජනය කරන ලද යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයෙකු වෙත අවසර ලබා දෙනු ලැබේ.

5. ප්‍රතිෂ්ඨාවක් නොමැතිව විදේශයන්හි වත්කම් හෝ ආයෝජන අත්පත්කර ගැනීම.

(1) විදේශ විනිමයෙන් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ වත්කම් ආකාරයෙන් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමකින් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකුගෙන් ලැබිය යුතු දෙයකට හුවමාරුවක් වශයෙන් හෝ කිසිඳු ප්‍රතිෂ්ඨාවක් ගෙවීමට සිදු නොවන අවස්ථාවක දී, විදේශයන්හි යම් වත්කමක් හෝ ආයෝජනයක් අත්පත් කර ගැනීම සහ දැරීම සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික යම් තැනැත්තකුට අවසර ලබා දෙනු ලැබේ.

(2) සේවක කොටස් හිමිකම් සැලැස්මක් හෝ සේවක කොටස් වරණීය ක්‍රමයක් හෝ යටතේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන්, උරුමයක් ලෙස හෝ ත්‍යාගයක් ලෙස ප්‍රවර්ධන කොටස් හෝ රන් කොටස් වශයෙන් තනි පුද්ගල ආයෝජකයකුට ප්‍රතිෂ්ඨාවක් නොමැතිව ලැබුණු කොටස් සහ එවැනි ආයෝජකයකුට නිකුත් කරන්නාගේ සංස්ථායී ක්‍රියාවක් ප්‍රකාරව හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වල ඒකාබද්ධ වීම හෝ සම්බන්ධවීම ප්‍රකාරව පසුව පැවරුණු කොටස් ඉහත අනුඡේදය සඳහා ඇතුළත් විය හැකි ය.

(3) එකී අත්පත් කර ගැනීම් උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත් නොවිය යුතු ය.

6. සේවක කොටස් හිමිකම් සැලැස්මෙහි හෝ සේවක කොටස් වරණීය ක්‍රමවල ආයෝජන-

(1) සිය සේවකයන් වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ පාලිත සමාගමකින් හෝ ශාඛාවකින් ගොනු මුදලක් ලෙස ප්‍රේෂණය කිරීමක් මත යම් විදේශ සමාගමකට ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සිදු කිරීම සඳහා යම් නියම කිරීමක් පවතින්නේ නම්, ගණුදෙනුවේ සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා, ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද එකී පාලිත සමාගමේ හෝ ශාඛාවේ ගිණුමකින් එම අරමුදල් මාරු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) සිය සේවකයන් වෙනුවෙන් එවැනි ගොනු මුදලක් ලෙස වූ ප්‍රේෂණයක් හෝ ප්‍රේෂණ සිදු කිරීම සඳහා අදහස් කරන ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ පාලිත සමාගම හෝ ශාඛාව, මේ නියෝග යටතේ අරමුදල් ප්‍රේෂණය කිරීමට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් එක් එක් සේවකයා වෙනුවෙන් නිෂ්කාශන ලිපියක් ලබාගත යුතු අතර එකී ප්‍රේෂණය සිදු කරන ලද දින සිට සතියක් ඇතුළත එකී ප්‍රේෂණයේ විස්තර විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත සපයනු ලැබිය යුතු ය.

7. ආයෝජනවල ආදායම් හෝ බැහැර කිරීමෙන් හෝ ඈවර කිරීමෙන් ලැබෙන ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාව වෙත යැවීම.

(1) උපලේඛනයේ මේ කොටසේ 1, 2 සහ 4 වන ඡේද යටතේ අවසරලත් ආයෝජනයන්හි යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීමක් එය ලද දිනයේ සිට මාස තුනක කාලයක් තුළ, ආරම්භක ආයෝජනය සිදු කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා ම ශ්‍රී ලංකාව තුළට රැගෙන ආ යුතු ය.

(2) සේවක කොටස් වරණීය ක්‍රමයක් හෝ සේවක කොටස් හිමිකම් සැලැස්මක් ප්‍රකාරව ලාභාංශ ආපසු සියරට යැවීමේ අවශ්‍යතාවය, ලාභාංශ එකී සේවක කොටස් වරණීය ක්‍රමයේ හෝ සේවක කොටස් හිමිකම් සැලැස්මේ කොටස්වල නැවත ආයෝජනය කිරීමේ යම් අනිවාර්ය හෝ වරණීය නියම කිරීමකට යටත් විය හැකි ය. උපලේඛනයේ මේ කොටසේ 6 ඡේදයේ (1) වන අනු ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි සේවක කොටස් වරණීය ක්‍රමය හෝ සේවක කොටස් හිමිකම් සැලැස්ම යටතේ ආයෝජනය සඳහා ගොනු මුදලක් ලෙස වන ප්‍රේෂණ ආකාරයෙන් අරමුදල් තම සේවකයන් වෙනුවෙන් ප්‍රේෂණය කර තිබෙන්නා වූ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් හෝ ශාඛාවක් සම්බන්ධයෙන් වන විට දී, එකී තනි පුද්ගල සේවකයන් විසින්, එම තනි පුද්ගල ආයෝජකයා බලයලත්

වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග විවෘත කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා එකී ආයෝජනවල ආදායම හෝ බැහැර කිරීමෙන් ලද ඉපැයුම් ශ්‍රී ලංකාව වෙත රැගෙන එනු ලැබිය යුතු ය.

(3) අදාළ වන පරිදි උපලේඛනයේ මේ කොටසේ 5 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි අත්පත් කර ගනු ලැබූ යම් විදේශයක පිහිටි වත්කම් හෝ ආයෝජනවලින් ලද යම් ආදායම් සහ ඒවා බැහැර කිරීමෙන් ලද යම් ඉපැයුම් ලැබීමක දී, එකී ලැබීම සිදුවූ දින සිට මාස තුනක් ඇතුළත උපලේඛනයේ මේ කොටසේ 8 වන ඡේදයේ (1) වන අනුඡේදයට සහ උපලේඛනයේ මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති වෙනත් කොන්දේසිවලට යටත්ව බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග එකී නේවාසික ආයෝජකයා විවෘත කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ දැනට පවතින ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හරහා ශ්‍රී ලංකාව තුළට ගෙන එනු ලැබිය යුතු ය.

8. ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා කරන ලද ආයෝජන උරුම වීම-

(1) උපලේඛනයේ මේ කොටසේ 5 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරනු ලැබූ, ආයෝජනයක්, උරුමකරුවකු හෝ අර්ථලාභියකු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වෙත උරුමයෙන් ලැබුණු හෝ තෑගි කරන ලද අවස්ථාවක දී, එම ආයෝජනවල වන යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීම්, එකී උරුමකරු හෝ අර්ථලාභියා විසින් විවෘත කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා ශ්‍රී ලංකාව වෙත ගෙන එනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු විසින් සිදු කරනු ලබන ආයෝජනයක්, අදාළ වන උරුම සහ අනුප්‍රාප්තික නීතියට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු වෙත පවරනු ලැබිය හැකි ය.

9. විගාමිකයකු බවට පත්වන නේවාසික තනි පුද්ගල ආයෝජකයකු සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ නේවාසිකයකු ලෙස සිටින අතරතුර ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා ඒ පුද්ගලයා ස්ථිර පදිංචිය ලබා ඇති රටෙහි කරන ලද යම් ආයෝජනයක මුළු වටිනාකම එකී පුද්ගලයාගේ සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාවෙන් අඩු කරනු ලැබිය යුතු ය.

10. නේවාසික ආයෝජකයන් සඳහා දිරිදීමනා;

ප්‍රතිමුඛ ආයෝජන ගිණුම වෙත බැර කරනු ලැබූ පෙර සිදු කරන ලද ප්‍රතිමුඛ ආයෝජනයන්ගේ ප්‍රාග්ධන ලාභ සියයට පනහ දක්වා අරමුදල් උපයෝගී කර ගනිමින් උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවෙහි නිශ්චිතව දක්වා ඇති අවසරලත් සීමාවන්ට යටත්වීමකින් තොරව, උපලේඛනයේ මේ කොටස යටතේ අවසරලත් කාර්යයන් සඳහා ආයෝජන සිදු කිරීමට සුදුසුකම්ලත් ආයෝජකයකු වෙත අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

11. සංස්ථායී ඇපකර සහ කොටස් ඔඩපනය කිරීම-

(1) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමක් (එනම් ආයෝජකයා) විසින් එකී ආයෝජකයා කොටස් හිමියකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමකට (එනම් ආයෝජිතයා) එකී ආයෝජිතයා හට මූල්‍ය ආයතනයකින් පහසුකම් ලබා ගැනීම සඳහා හෝ ආයෝජිතයා විසින් එළඹ ඇති ගිවිසුමක් සඳහා පහසුකම් සලසා ගැනීම සඳහා සංස්ථායී ඇපකරයක් ලබාදීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ආයෝජිතයා තුළ එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම් සහ සංස්ථායී ඇපකරයේ වගකීම දැරීම සඳහා එම සමාගමේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නම්, එ.ජ.ඩො. 1,000,000 ක උපරිම සීමාවකට යටත්ව සංස්ථායී ඇපකරයක් නිකුත් කරනු ලැබිය හැකි ය. සංස්ථායී ඇපකර තුළින් පැන නගින යම් අවිනිශ්චිත වගකීමකට මුහුණදීම සඳහා සමාගම සතුව මූල්‍ය ශක්තිය පවතින බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික විය යුතු ය. ඇපකරයේ වටිනාකම යම් නිශ්චිත අවස්ථාවක දී එකී ආයෝජිතයා තුළ ඇති ආයෝජකයාගේ කොටස් හිමිකාරීත්වයේ ප්‍රතිශතයට සමානුපාතික විය යුතු අතර ආයෝජිතයා විසින් (සංස්ථායී ඇපකරයේ සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයේ පිටපත් ද ඇතුළුව) ඉහත අවසරය යටතේ නිකුත් කරන ලද එකී එක් එක් සංස්ථායී ඇපකරයේ විස්තර, එකී ඇපකරය බලාත්මක වන දින සිට දින 14 ක් ඇතුළත මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ලබා දීම අවශ්‍ය වන්නේ ය.

(2) පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට ඉහත (1) වන අනුඡේදයෙහි සඳහන් සංස්ථායී ඇපකරවලට අදාළ වලංගු හිමිකම්වලින් පැන නගින ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීම සඳහා ද අවසර ලබා දෙනු ලැබේ.

(3) මේ නියෝගවල හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවල අවසර ලබා දී ඇති පරිදි, ආයෝජිතයා තුළ නේවාසික ආයෝජකයකු විසින් අත්පත් කර ගෙන ඇති කොටස්, මූල්‍ය ආයතනයකින් ආයෝජිතයා විසින් ලබාගැනීමට අදහස් කරන පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා හෝ ආයෝජිතයා විසින් බැඳී සිටින ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම සඳහා ලියමක් ලෙස භාවිත කරනු ලැබිය හැකි ය. ලියම, ආයෝජිතයා තුළ ආයෝජකයා විසින් දරනු ලබන කොටස් හිමිකමේ සීමාවට සමානුපාතික විය යුතු ය.

(4) ඉහත (1) වන සහ (3) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ඇපකර හෝ ලියම සඳහා පහත දැක්වෙන කොන්දේසි ද බලපැවැත්විය යුතු ය:-

(අ) (පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක දී) හිමිකමේ වටිනාකම ආපසු අයකර ගැනීම සඳහා සංස්ථායී ඇපකරය නිකුත් කිරීමට හෝ ලියමට එළඹීමට පෙර, නේවාසික ආයෝජකයා විසින් ආයෝජිතයා සමග සුදුසු නීතිමය ගිවිසුමක් ඇති කර ගත යුතු ය;

(ආ) වලංගු හිමිකම් පෑමක දී, හිමිකමේ උපරිම සීමාව, පාදක පහසුකමේ ඉතිරිව පවතින වගකීමට සමානුපාතික හෝ ඊට වඩා අඩු හෝ විය යුතු ය;

(ඇ) ඉහත (අ) අයිතමයේ සඳහන් පරිදි වූ එකී ආපසු අයකර ගැනීම්, ආයෝජනය සිදු කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමටම රැගෙන එනු ලැබිය යුතු ය.

12. වෙනත් නියම හා කොන්දේසි;

(1) සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා උපලේඛනයේ මේ කොටසේ 1 වන වගුව යටතේ නිශ්චිතව දක්වා ඇති ආයෝජන සඳහා එක් එක් ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සිදු කිරීමට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් නිෂ්කාශන ලිපියක් ලබා ගත යුතු ය. පසුකාලීනව විදේශ ආයෝජන සිදු කිරීමට අදහස් කරනු ලබන යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින් මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයක් ප්‍රකාරව ඒ බව සනාථ කරන ලේඛනද, සමග එකී සුදුසුකම් ලත් ආයෝජකයා විසින් පෙර සිදු කරන ලද ආයෝජනයන්හි ප්‍රගතිය සහ තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ අධි සාමාජිකයකුගෙන් හෝ වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ (සී.එෆ්.ඒ. ආයතනයේ) බලපත්‍ර දරන්නකුගෙන් ලබා ගත් සහතිකයක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත සපයනු ලැබිය යුතු ය. එකී සුදුසුකම් ලත් ආයෝජකයා විසින් පෙර සිදුකරන ලද ආයෝජනයන්හි ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව සහ උපලේඛනයේ මේ කොටසේ 3 වන ඡේදයට යටත්ව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් එකී නිෂ්කාශන ලිපිය නිකුත් කළ යුතු ය.

(2) මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත ලැයිස්තුගත නොකළ සමාගමක අවසරලත් ආයෝජනයක් සිදු කර ඇති ආයෝජක සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එකී ආයෝජනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්ෂිකව සමාලෝචනයක් සිදු කළ යුතු අතර ආයෝජිතයාගේ ලාභ සහ පාඩු, ආයෝජිතයා විසින් ප්‍රකාශිත ලාභාංශ හෝ ආයෝජකයා වෙත ලාභාංශ ලැබීම පිළිබඳ විස්තර ඇතුළත් ඒ පිළිබඳව වූ වාර්තාව ඊළඟ වර්ෂයේ මාර්තු 31 වන දින හෝ ඊට පෙර හෝ විශේෂිත ආයෝජනයක් සම්බන්ධයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් එවැනි දිනයක අදාළ බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා වෙත පිටපතක් ද සහිතව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත යවනු ලැබිය යුතු ය.

(3) (තනි පුද්ගලයන් හැර) සුදුසුකම්ලත් ආයෝජකයා විසින් මේ නියෝග යටතේ අවසරලත් ආයෝජනය සිදු කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස පසුගිය වසර තුන සඳහා යහපත් මූල්‍ය තත්ත්වයක් සහ කාර්යසාධනයක් පවත්වාගනු ලැබ තිබිය යුතු ය. විදේශයක වූ නියාමනය කරන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් තුළ වන අවසර ලත් ආයෝජන හැර, සුදුසුකම්ලත් ආයෝජකයා විසින්, මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි, වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ අධි සාමාජිකයකුගෙන් හෝ වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනයේ බලපත්‍ර දරන්නකුගෙන් එකී ආයෝජකයාගේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය සම්බන්ධයෙන් වන නිර්දේශයක් සහ යෝජිත ආයෝජනයේ ශක්‍යතාවය, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ලබා දිය යුතු ය.

## II වන කොටස

පනත ක්‍රියාත්මක වීමට පෙර ප්‍රදානය කර ඇති යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලබන සහ මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මගින් හෝ යම් පසුකාලීන නියෝග මගින් විශේෂයෙන් වෙනස් කරනු ලබන්නේ නම් මිස එකී අනුමැතිය යටතේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතු ය.

III වන කොටස

**ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ බලය**

1. ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්

මේ නියෝගයටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීම සඳහා පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, පහත දැක්වෙන සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නමින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත බලය තිබිය යුතු ය:-

(අ) ඇපයෙන් සීමිත සමාගමක් නොවන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම්;

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ (ඉහත (අ) සහ (ආ) යටතේ වන සුදුසුකම්ලත් ආයෝජකයන් හැර) නියාමනය කරන ලද හෝ බලපත්‍රලාභී අස්ථිත්වයන්;

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හෝ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද වෙනත් යම් සේවක අර්ථසාධක අරමුදලක්;

(ඉ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්; සහ

(ඊ) (අදාළ විය හැකි පරිදි) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු හෝ/එකී පුද්ගලයා විසින් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද තනි පුද්ගල ව්‍යාපාරයක් සහිත ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු

2. වෙනත් නියම සහ කොන්දේසි

(1) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සහ එකී ගිණුම් සඳහා වන අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සඳහා වන නිර්ණායක, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අදාළ විධාන මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි විය යුතු ය.

(2) මේ කොටසේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අපේක්ෂා කරන තැනැත්තන්, එකී ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අදාළ විධානවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක යටතේ සුදුසුකම් ලබන්නේ ද යන්න පිළිබඳව නිශ්චය කිරීම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලෙන් ක්‍රියා කළ යුතු ය. සෑම බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දකු ම විසින් ගිණුම් පවත්වාගෙන යන කාලය තුළ සහ එකී ගිණුම් වසා දැමීමෙන් පසු වසර හයකට නොඅඩු කාල සීමාවක් සඳහා, ගිණුම් හිමියන්ගේ සුදුසු බව සනාථ කිරීමක් වශයෙන් ඔවුන් සම්බන්ධ තොරතුරු සහ ලේඛනගත සාක්ෂි පවත්වාගෙන යා යුතු ය.

02 - 377

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.